මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාතර්මේන්තුව |
|---|---|
| දිනය | 2022.06.25 |

**විදේශ ව්‍යවහාර මුදල් සන්තකයේ තබා ගැනීමේ සීමාවන්, නියමයන් හා කොන්දේසි සංශෝධනය කිරීම**

මහජනතාව අත ඇති විදේශ ව්‍යවහාර මුදල් විධිමත් බැංකු පද්ධතියට ආකෂර්ණය කර ගැනීමේ අරමුණින් මුදල් අමාත්‍යවරයා විසින්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ නියමයන් පහත පරිදි නිකුත් කර ඇත.

1) ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයෙකුට තම සන්තකයේ රඳවා තබා ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර් 15,000 සිට **ඇ.එ.ජ. ඩොලර් 10,000 හෝ ඊට සමාන වෙනත් විදේශ විනිමය ප්‍රමාණයක්** දක්වා අඩු කිරීම.

2) පහත සඳහන් දෑ සඳහා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයන් සඳහා, **නියමය බලාත්මක වන දිනයේ සිට (**2022 ජූනි 16) **වැඩ කරන දින 14 ක පොදු සමා කාලයක්** ලබා දීම.

   (i) නියමයේ දක්වා ඇති පරිදි, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට **තැන්පත් කිරීමට**

   හෝ

   (ii) බලයලත් වෙළෙන්දෙකුට (බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට) **විකිණීමට**

එකී පොදු සමා කාලය අවසානයේ දී මෙම නියමය උල්ලංඝනය කරමින් තමා සන්තකයේ විදේශ ව්‍යවහාර මුදල් තබා ගන්නා පුද්ගලයන්ට එරෙහිව විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර් ග ආරම්භ කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

වැඩිදුර තොරතුරු සඳහා;

(අ) ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ සම්බන්ධ වීමට

(ආ) විදේශ විනිමය දෙපාතර්මේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dfe.lk මගින් විදේශ විනිමය පනතේ 8 වැනි වගන්තිය යටතේ වූ නියමයට 2022 ජූනි 16 දිනැති අංක 2284/34 දරන (අති විශෙෂ) ගැසට් නිවේදනය මගින් සිදු කරන ලද ඉහත සංශෝධනයන් පරිශීලනය කිරීමට,

(ඇ) dfe@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයෙන් හෝ 011-2477255, 011-2398511 යන දුරකතන අංක මගින් විදේශ විනිමය දෙපාතර්මේන්තුව හා සම්බන්ධ වීමට හැකියාව ඇත.